www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ඩේවිඩ් නෝර්ත්: ලෝක සමාජවාදී වෙබ් අඩවියේ (ලෝසවෙඅ) ජාත්‍යන්තර කර්තෘ මන්ඩලයේ (ජා.ක.ම) රැස්වීමට ඉදිරිපත් කරන ලද වාර්තාව

**David North: Opening report to meeting of WSWS International Editorial Board**

**ඩේවිඩ් නොර්ත් විසිනි**
**2006 පෙබරවාරි 24**

*පහත පල කරනු ලැබ ඇත්තේ (ඕස්ට්‍රේලියාවේ) සමාජවාදී සමානතා පක්ෂයේ සත්කාරකත්වයෙන් 2006 ජනවාරි 22 සිට 27 දක්වා සිඩ්නි නුවර දී පවත්වන ලද ලෝසවෙඅ විස්තෘත රැස්වීමකට එහි ජාත්‍යන්තර කර්තෘ මන්ඩලයේ සභාපති ඩේවිඩ් නෝර්ත් ඉදිරිපත් කල ආරම්භක වාර්තාවයි.*

*මෙම වාර්තාව වනාහි හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ශාඛාවන්ගෙන් පැමිනි ලෝසවෙඅ ජා.ක.ම. ප්‍රධාන සාමාජිකයන් සහ නියෝජිතයින් විසින් ඉදිරිපත් කරන ලද වාර්තා ගනනාවකින් මුල්ම එක ය. ඉතිරි වාර්තා ද මින් ඉක්බිති ලෝසවෙඅ විසින් පල කෙරෙනු ඇත.*

ලෝක සමාජවාදී වෙබ් අඩවියේ ජාත්‍යන්තර කර්තෘ මන්ඩලයේ මෙම විවෘත රැස්වීමට පැමින සිටින ඔබ සියලු දෙනාම හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව වෙනුවෙන් සාදරයෙන් පිලිගැනීමට කැමැත්තෙමි.

මෙම රැස්වීම, පසුගිය 2005 අගෝස්තුවේ මිචිගන් නුවර පැවැත්වුනු ජාත්‍යන්තර පාසලට වඩා වෙනස් ස්වරූපයක් දරනු ඇති බව ආරම්භයේ දී ම පැවසීමට මම කැමැත්තෙමි. අගෝස්තුවේ දී ඉදිරිපත් කෙරුනු දේශන හතර වන ජාත්‍යන්තරයේ ඓතිහාසික අත්තිවාරම් පරීක්ෂා කිරීමකට ය යොදන ලද්දේත මෙම දේශනයන්හි කේන්ද්‍රීය යොමුව වූයේ විසි වන ශතවර්ෂයේ ප්‍රථම දශක කිහිපය යි.

මෙම සතිය තුල දී, අපගේ කේන්ද්‍රීය යොමුව වනු ඇත්තේ අතීතයට වඩා වර්තමානය ය. ඉතිහාසයට වඩා සමකාලීන දේශපාලනය ය. අපි අගෝස්තු මාසයේ දී හතර වන ජාත්‍යන්තරය පැන නැංගා වූ ඓතිහාසික අත්දැකීම් පරීක්ෂා කලෙමු ත ඉදිරි දින කිහිපය යොමු වනු ඇත්තේ වර්තමාන දේශපාලන තත්වය විග්‍රහ කිරීමට ද ලෝක සමාජවාදී වෙබ් අඩවියේ වැඩ කටයුතු පදනම් ව පවත්නා ජාත්‍යන්තර ඉදිරි දර්ශනයන් පැහැදිලි කිරීමට ද වේ.

දේශපාලන පූර්වඥානයක් සඳහා දරෙන කුමන බරපතල ප්‍රයත්නයක් වුව ද, වර්තමාන දේශපාලන තත්වය තුල පවත්නා ශක්‍යතාවන් පිලිබඳ කුමන තක්සේරුවක් වුව ද මුලපිරිය යුතු වන්නේ ලෝක ධනේශ්වර පද්ධතියේ ඓතිහාසික වර්ධනය පිලිබඳ නිශ්චිත හා නිරවද්‍ය වැටහීමකිනි.

ධනවාදයේ ඓතිහාසික වර්ධනය පිලිබඳ විශ්ලේෂනය පහත සඳහන් සාරභූත ප්‍රශ්නයට පිලිතුරු සැපයිය යුතු යඃ ධනවාදය ලෝක ආර්ථික පද්ධතියක් ලෙස ගමන් කරමින් පවතින්නේ ආරෝහක (ඉහලට ගමන් කරන) පථයක ද, එය තව මත් එහි මුදුනට නගිමින් පවතින්නේ දැ? එසේත් නැත හොත් එය පවතින්නේ පරිහානියට යමින් ද එපමනක් නොව පාතාලයකට ඇද වැටෙමින් දැ?

අප මෙම ප්‍රශ්නයට දෙන උත්තරය, අපගේ ප්‍රායෝගික වැඩ කටයුතු තෝරා බේරා ගැනීම සඳහා පමනක් නොව අපගේ ව්‍යාපාරයේ මුලු මහත් න්‍යායික සහ ක්‍රියාමාර්ගික දිශානතිය සඳහා ද අනිවාර්යයෙන් ම ඉතා දුරදිග යන බලපෑමක් ඇති කරයි. ලෝක ධනේශ්වර පද්ධතියේ ඓතිහාසික තත්වය පිලිබඳව අපගේ විශ්ලේෂනය නිර්නය කරනු ලබන්නේ, සමාජ විප්ලවය උදෙසා වූ කිසියම් ආත්මීය ආශාවක් විසින් නො වේ. ඒ වෙනුවට කල යුතු ව ඇත්තේ විප්ලවවාදී ඉදිරි දර්ශනය සමාජ ආර්ථික වර්ධනයේ වෛෂයික ප්‍රවනතාවයන් පිලිබඳව විද්‍යාත්මක පදනමක් මත කෙරෙන ඇගැයීමක් තුල මුල් බැස ගැනීම ය.

අවශ්‍ය සමාජ ආර්ථික පූර්වාවශ්‍යතාවන්ගෙන් වෙන් කර දමනු ලැබූ කල්හි, විප්ලවවාදී ඉදිරි දර්ශනයකට මනෝරාජික නිර්මිතයකට වැඩි දෙයක් විය නොහැකි ය.

එසේ නම් අප ධනවාදයේ ඓතිහාසික වර්ධනයේ වත්මන් අවධිය කෙසේ වටහා ගන්නේ දැයි අශමනීය ලෙස ප්‍රතිවිරුද්ධ සංකල්ප දෙකක් අපි මෙහි දී සැලකිල්ලට බඳුන් කරමු. මාක්ස්වාදී ආස්ථානය නම්, අප දන්නා පරිදි, ලෝක ධනේශ්වර පද්ධතිය අර්බුදයේ උග්‍රතම අවධියකට පත් ව ඇති බව යි. සත්තකින් ම 1914 ලෝක යුද්ධය පුපුරා යාම ද ඉන් ඉක්බිත්තේ එළඹි 1917 රුසියානු විප්ලවය ද ලෝක ඉතිහාසයේ අතිමූලික සන්ධිස්ථානයක් නියෝජනය කලේ ය. ප්‍රථම ලෝක යුද්ධය පුපුරා යාම ද 1945 දෙවන ලෝක යුද්ධය අවසාන වීම ද අතර දශක තුනකට වැඩි කාලයක ප්‍රලයකාරී සිද්ධීහු ධනවාදය එහි ප්‍රගතිශීලී ඓතිහාසික කර්තව්‍යය අවසානයට පත් වීමෙන් ඉක්බිතිව ද පන ගැටගසාගෙන සිටින බවත්, ලෝක ආර්ථිකය සමාජවාදී ව පරිවර්තනය කිරීම සඳහා වෛෂයික පූර්වාවශ්‍යතාවන් ඉස්මතු ව ඇති බවත් විදහා දැක්වූහ. ධනවාදය මෙම දශක කිහිපයේ අර්බුදයෙන් පසු රැකී පැවැත්මට සමත් වීය යන කරුන බොහෝ දුරට, මහා ජන පක්ෂයන්හි හා සංවිධානයන්හි නායකත්වයන්ගේ, අන් සියල්ලටමත් වඩා සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂ, කොමියුනිස්ට් පක්ෂ සහ වෘත්තීය සමිතිවල අසාර්ථකත්වය සහ පාවාදීමේ ප්‍රතිඵලයක් වූයේ ය. දෙවන ලෝක යුද්ධයෙන් පසු ලෝක ධනවාදය -- ඒ වනවිට සැලකිය යුතු මට්ටමක පැවති එක්සත් ජනපදයේ සම්පත්වල ආධාරයෙන් -- යලි පුනරුත්ථාපනය වීම ඉහත සඳහන් පාවාදීම්වලින් තොර ව, සිදු කල නො හැකි විය. සත්තකින් ම, පශ්චාත් යුද කාලීන ස්ථාවරකරනය තිබිය දී වුව ද ලෝක කම්කරු පන්තියේ ද පැරනි යටත් විජිතවල පීඩිත ජනතාවගේ ද ධනවාදයට එරෙහි භූගෝල පරිමාන විරෝධය දිගින් දිගටම පැවැත්තේ යත එහෙත් එම විරෝධයේ විප්ලවවාදී විභවය පැරනි නිලධාරිතන්ත්‍රීය සංවිධාන විසින් යටපත් කරනු ලැබිනි.

අන්තිමේ දී, 1960 ගනන් හා 1970 ගනන්වල මහාජන අරගලයන් පාවාදීම හා පරාජයට පත් වීම ධනේශ්වරයේ ප්‍රතිප්‍රහාරයකට මග පෑදී ය. ධනේශ්වර පද්ධතියේ පෙර නුවූ විරූ භූගෝලීය ඒකාග්‍රකරනය ජාතික ඉදිරි දර්ශනයක් මත පදනම් ව පැවැති පැරනි කම්කරු පන්ති සංවිධාන සුන්කර දැමී ය.

ජාතිකවාදී ව්‍යාජ-සමාජවාදයක බංකොලොත් ප්‍රතිමාක්ස්වාදී ක්‍රියා මාර්ගය මත පදනම් වූ, සෝවියට් සංගමයේ සහ නැගෙනහිර යුරෝපයේ ස්ටැලින්වාදී තන්ත්‍රයන්හි බිඳවැටීම මෙම ගෝලීකරන සන්තතියේ විපාකයක් විය.

1990 ගනන්වල ධනවාදයේ වේගවත් භෞමික ප්‍රසාරනය තිබියදී ම, ඓතිහාසික අර්බුදය නො නැවතී දිගින් දිගට ම පැවතුනා පමනක් නොව ගැඹුරු ද විය. පැරනි කම්කරු ව්‍යාපාරවලට මාරක බවට පත් වූ ගෝලීකරන සන්තතීහු ලෝක ආර්ථික ක්‍රමයක් හැටියට ධනවාදයේ භූගෝල පරිමාන ඒකාග්‍රිත ස්වභාවය සහ ධනවාදය ඓතිහාසිකව මුල් බැස පවත්නා වූ ද එයට ගැලවීගත නො හැක්කා වූ ද ජාතික-රාජ්‍ය ව්‍යූහය අතර ප්‍රතිසතිතාවය පෙර නුවූ විරූ ආතති සහගත මට්ටමකට ඔසොවා ලූහ. මෙම ප්‍රතිසතිතාවේ සාරභූත නොවිසඳිය හැකි බව - නැත හොත්, මොනයම්මැ හෝ ප්‍රගතිශීලී පදනමක එය ,විසඳාලිය නොහැකි බව, වත්මන් ලෝක තත්වය විලක්ෂනය කරන්නා වූ එන්න එන්න ම උග්‍ර වන විපර්යාසය සහ ප්‍රචන්ඩතාව තුල දෛනික ප්‍රකාශනයක් අත් කර ගනී. විප්ලවවාදී මහා පෙරලිවල යුගයක් එළඹ ඇත. කෙටියෙන් ගත් කල්හි එයයි මාක්ස්වාදී විශ්ලේෂනය.

ඊට විකල්ප ඉදිරි දර්ශනය කුමක් ද? අප පහත දැක්වෙන ප්‍රති විරුද්ධ උපන්‍යාසය සලකා බලමු.

ලියොන් ට්‍රොට්ස්කිගේ විචිත්‍ර වාක්‍යාංශය යොදාගතහොත්, මාක්ස්වාදීන් ,ධනවාදයේ මරලතෝනිය, යනුවෙන් නම් කල තත්වය, ඊට වෙනස්ව පෙන්නුම් කලේ ධනේශ්වර ක්‍රමයේ ප්‍රචන්ඩ හා දිග්ගැසුනු උත්පත්ති වේදනාවයි. 20 වන ශතවර්ෂයේ විවිධ සමාජ හා විප්ලවවාදී පර්යේෂන වනාහි හුදෙක් නො මේරූ පමනක් නොව සාරභූත වශයෙන් ම මනෝරාජික ද විය. විසි වන ශතවර්ෂයේ ඉතිහාසය වටහාගත යුත්තේ ආර්ථික සංවිධානයේ සුපිරි පද්ධතිය ලෙස ධනවාදය වෙලඳපලේ අනිවාරනීය ජයග්‍රහනයට පැවැති සකල බාධාවන් ජයගැනීම පිලිබඳ කතන්දරය ලෙස ය. සෝවියට් සංගමයේ බිඳ වැටීම ද චීනය වෙලඳපල ආර්ථිකය දෙසට හැරී ගැනීම ද මෙම සන්තතියේ මස්තකප්‍රාප්තිය නියෝජනය කලේ ය. වත්මන් දශකය ද, හොඳට ම සිදු විය හැකි පරිදි ඉක්බිතිව එළඹෙන දශකය ද ආසියාව පුරා ධනවාදයේ වේගවත් ප්‍රසාරනය දිගින් දිගට ම අත් දකිනු ඇත. මෙම සන්තතියේ ඉතාමත් ම අර්ථභාරී අංගය වනු ඇත්තේ චීනය සහ ඉන්දියාව මුහුකුරා ගිය ස්ථාවර ලෝක ධනවාදී බලවතුන් බවට පත් වීම ය.

එපමනක් නො ව මෙම උපන්‍යාසය නිවැරදි නම් -- ඩබ්ලිව්. ඩබ්ලිව්. රොස්ටොව්ගේ ආදර්ශ කල්පිතය අනුව ධනවාදය අවුරුදු 20 ක් ඇතුලත අප්‍රිකාවේ ද මැද පෙරදිග ද "ඉදිරි පිම්මක" අවධියට එළඹෙනු ඇත. නයිජීරියාව, ඇන්ගෝලාව, දකුනු අප්‍රිකාව, ඊජිප්තුව, මොරොක්කෝව සහ ඇල්ජීරියාව ද (මීට අමතරව හෝ මේවා වෙනුවට) වෙනත් රටවල් ද පුපුරා යන ආර්ථික වර්ධනයක් අත් දකිනු ඇත. මේ අනුව මී ලඟ අඩ

සියවස තුළ දී - සමහර විට 2047 දී (අදින් අවුරුදු 41 පමනක් ගත වූ පසුව) කාල් මාක්ස්ගේ හා ෆ්‍රෙඩ්රික් එංගල්ස්ගේ කොමියුනිස්ට් ප්‍රකාශනයේ දෙසිය වන සංවත්සරය හුදෙක් ශාස්ත්‍රීයව සිහිකිරීමේ අවස්ථාව එලඹීමට ද පෙරාතුව ලෝක ධනවාදයේ භූගෝල පරිමාන විජයග්‍රහනය සම්පූර්න ද ස්ථිරසාර ද වනු ඇත.

මෙම උපන්‍යාසය වත්මත් සමයේ භූගෝලීය සන්තතීන් වටහා ගැනීම සඳහා යථාර්ථ පදනමක් සම්පාදනය කරයි ද? එය එසේ කරයි නම්, එවිට මාක්ස්වාදයේ විප්ලවවාදී ඉදිරි දර්ශනයෙන් ඉතිරි වන්නේ අල්පමාත්‍රයකි. කම්කරු පන්තියේ ජීවන තත්වයන් පිලිබඳ සියලු උත්සුකයන් අත්හැර දැමීමට අපට ඉන් බල කෙරෙනු නැත. සත්තකින්ම අපගේ උනන්දුවට භාජනවනු ඇති තත්වයන් නො අඩුවනු ඇත. ලෝකයේ දුප්පතුන් හා සූරාකෑමට ගොදුරු වූවන්ගේ තත්වයන් ආරක්ෂා කිරීම සඳහා අවම ඉල්ලීම් මාලාවක් සූත්‍රගත කිරීමට අප උත්සාහ කරනු ඇත. එහෙත් මෙය වනාහී යම් තරමකට සමාජ මානවහිතවාදයේ ප්‍රයත්නයක් වනු ඇත. කලින් මාක්ස්වාදීන් ව සිටි අයට අඩු වශයෙන් ඓතිහාසිකව පෙර දැකිය හැකි කාලයක් තුල විප්ලවවාදී ව්‍යාපෘතියේ මනෝරාජික ස්වභාවය පිලිගැනීමට සිදු වී තිබෙනු ඇත. ඔවුන්ට මේ අනුව අතීතය පිලිබඳ තම වැටැහීම සැලකිය යුතු ආකාරයකට සංශෝධනය කිරීමට ද බල කෙරෙනු ඇත.

එහෙත් - භූගෝල පරිමානව විජයග්‍රාහී වූ ධනවාදයක් පිලිබඳ - මෙම උපන්‍යාසය යථාර්ථවත් ද? දැනට ම ලෝක ධනේශ්වර පර්යායේ සිතිජය මත දිස්වන පුපුරා යාමේ විභවයක් ඇති බොහෝ ගැටලු එම පර්යායේ පැවැත්මට ම තර්ජනය කිරීමට පෙරාතුව විසඳාගැනීමට හෝ අඩු වශයෙන් රඳවා තබා ගැනීමට ඉඩ සලසන තත්වයන් මාලාවක් පරිකල්පනය කර ගැනීම අතීතයේ සියලු ම ඓතිහාසික අත්දැකීම්වල එලියෙන් ගත් කල්හි යුක්ති යුක්ත ද?

අධිරාජ්‍ය පර්යායේ රාමුව ඇතුලත ප්‍රධාන ලෝක බලවතුන් අතර පවත්නා භූ-දේශපාලනමය සහ ආර්ථික සට්ටනයන්, ජාත්‍යන්තර දේශපාලනය ප්‍රගාඪ ලෙස අස්ථායී කර දමන්නා වූ ස්ථානය කරා සේන්දු වනවා පමනක් නො ව එතැන ඉක්මවා යාමට ද පෙර සාකච්ඡා සහ බහු-පාර්ශවීය එකඟතා පදනමේ විසඳාලනු ලැබීමට ඉඩකඩ පවතීය යි අපි විශ්වාස කරන්නෙමු ද?

ආර්ථික සංවර්ධනය සඳහා තීරනාත්මක - විශේෂයෙන් ම තෙල් නොවන එහෙත් තෙල් පමනක් - අමු ද්‍රව්‍යවලට ලං වී ගැනීම සඳහා ද ඒවා පාලනය කිරීම සඳහා ද - ඇති වන තරගය ප්‍රචන්ඩ සට්ටනයන්ගෙන් තොරව විසඳා ලීම සම්භාව්‍යව සිදු විය හැක්කක් ද?

ප්‍රාදේශීය අනුහස සඳහා සිදු වන ගනන් නැති අරගල - චීනය සහ ජපානය නැත හොත් චීනය සහ ඉන්දියාව අතර ආසියාවේ ආධිපත්‍යය සඳහා සිදුවන්නා වූ අරගල සන්නද්ධ සට්ටනයන් ගෙන් තොරව විසඳාලිය හැකි ද?

භූගෝලීය ආර්ථිකය අතිමූලිකව අස්ථායි කිරීමේ විපාකය ඇති නො කොට ඇමරිකා එක්සත් ජනපදයට ඩොලර් ට්‍රිලියන ගනනක ප්‍රවර්තන ගිනුම් හිඟ දිගින් දිගට ම ගොඩගසාගෙන යා හැකි ද?

ඇමරිකා එක්සත් ජනපදයේ පැන නගින මහා ආර්ථික අර්බුදයක් බරපතල මූල්‍ය කලබැගෑනියකින් තොරව උකහා ගැනීමට ලෝක ආර්ථිකය සමත්වේ ද?

චීනයේ නැග එන අනුහස හිතෛශීව සහ සාමකාමීව ඉවසා දරා සිටීමට ඇමරිකා එක්සත් ජනපදය සමත්වේ ද?

සමාජ අංශයේ ලා ගත් කල්හි බරපතල සහ ප්‍රචන්ඩ මට්ටමක සට්ටන ඇති කරන්නේ නැතිව ඇමරිකා එක්සත් ජනපදය, යුරෝපය සහ ආසියාව පුරා සමාජ අසමානතාවය කම්පාකාරී ලෙස පැතිර යාම දිගින් දිගට ම සිදු වෙමින් පවතිනු ඇත් ද? තමන්ගේ ජීවන මට්ටම් නොකඩවා පහතට ඇද වැටීම බරපතල හා කටුක විරෝධයකින් තොරව දශක ගනනාවක් තිස්සේ උසුලාගෙන සිටීමට ඇමරිකානු කම්කරු පන්තිය සූදානම් වනු ඇතැයි යන මතයට එක්සත් ජනපදයේ දේශපාලන සහ සමාජ ඉතිහාසය දෙස් දෙන්නේ ද?

ලෝක ධනවාදය ප්‍රසාරනයේ හා ස්ථාවරත්වයේ නව ස්වර්නමය යුගයකට ඇතුලු වී ඇතැයි නිගමනය කිරීමට පෙර උත්තර දිය යුතුව ඇත්තේ ඉහත සඳහන් ජාතියේ ප්‍රශ්නයන්ට ය.

ඉදිරියේ එන සතිය තුල සාකච්ඡාවට බඳුන් වනු ඇත්තේ මෙම ප්‍රශ්නයන් ය. එහෙත් ලෝක ධනවාදයේ තත්වය පිලිබඳ ව විශේෂ අවධානයක් දිය යුතු වූ එක් දර්ශකයක් පවතී. ධනවාදයේ ඓතිහාසික වර්ධනය සිදු වූයේ ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදයේ පැනනැඟීමත් සමග බැඳී ගෙන ය. ධනවාදයේ නැගීම ද ප්‍රජාතන්ත්‍ර අයිතිවාසිකම් ප්‍රසාරනය ද අතර නිශ්චිත සම්බන්ධතාවක් ඓතිහාසිකව පැවැත්තේ ය. ඇමරිකා එක්සත් ජනපදයේ සම්භවය සදාකල්හි ම 'අවියෝජනීය අයිතිවාසිකම්' ප්‍රකාශනය කිරීම ද 'මූලික අයිතිවාසිකම්' ස්ථාපනය කිරීම ද සමග බැඳී පැවැත්තේ ය. ධනවාදයේ ඓතිහාසික ගමන් පථය තව මත් පවතින්නේ ආරෝහන අවධියක නම්, දේශපාලන ප්‍රජාතන්ත්‍රය අන් සියල්ලට මත් වඩා එක්සත් ජනපදය තුල මෙතරම් හින්දුරව (බිඳෙන සුලු) පවත්නේ මන් ද?

ඇමරිකා එක්සත් ජනපදයේ හිටපු උපජනාධිපති වූ ද, 2000 ජනාධිපති වරනයේදී වැඩිම ඡන්ද සංඛ්‍යාවක් ලබා ගත් ජනාධිපති අපේක්ෂකයා වූ ද අල් ගෝර්, මාර්ටින් ලූතර් කිං සමරුදිනයේ දී කල කථාවෙන් ඇමරිකානු ප්‍රජාතන්ත්‍රය දැන් ඇද වැටී පවත්නා තත්වය මෙසේ විස්තර කලේ ය. මෙම කතාව වාර්තා කරනු ලැබුවේ ඉතා සුලුවෙනි. ප්‍රධාන ඇමරිකානු පුවත්පත්වල එය ගැන සැලකිය යුතු සඳහන් කිරීමක් වත් සිදු වූයේ නැත. එසේ වුව ද අල් ගෝර් ඇමරිකා එක්සත් ජනපදයේ ප්‍රජාතන්ත්‍රවාදයේ තත්වය පිලිබඳව දුන් පින්තූරය අතිශයින් ම කිලි පොලන සුලු ය. ඔහුගේ කතාවෙන් ඉතා වැදගත් ඡේද කිහිපයක් උපුටා දැක්වීමට මට අවසර.

අල් ගෝර් මෙසේ කියා සිටියේ යඃ "උදාහරනයක් හැටියට ඔබ දැන සිටින පරිදි ජාතියට තර්ජනයක් ය යි ජනාධිපතිවරයා ම පමනක් තීන්දු කරන්නා වූ ඕනෑම ඇමරිකානු පුරවැසියකු අල්ලා සිර කිරීමට ද එම පුද්ගලයාගේ ඇමරිකානු පුරවැසි බව නොතකා ම, අඩුගනනේ ජනාධිපතිවරයා හෝ ඔහු විසින් පත් කරන ලද බලධාරීන් අත්වැරැද්දක් කරමින් සිර කොට ඇත්තේ වැරදි පුද්ගලයා යි තර්ක කිරීමට නීතිඥයකු සමග කථා කිරීමේ අයිතිය සිරගත වූ පුද්ගලයාට අහිමි යයි තවුරු කෙරෙන මෙතුවක් කල් පිලිගැනී නොතිබුනු අයිතියක් තමාට පවතින බව ජනාධිපතිවරයා විසින් ප්‍රකාශ කර තිබේ.

"අත් අඩංගුවට ගැනීමේ වරෙන්තුවකින් පවා තොර ව, ඔවුන්ට විරුද්ධව පවරා ඇත්තේ කුමන චෝදනා දැයි දැනුම් දීමකින් පවා තොර ව, ඔවුන් සිරකර ඇති බව ඔවුන්ගේ පවුල්වලට හෝ දැනුම් දීමකින් තොර ව ඇමරිකානු පුර වැසියෙකු - තමාට උවමනා ඕනෑ ම ඇමරිකානු පුරවැසියෙකු - මුලු ජීවිත කාලයක් ම සිරගත කර තබාලත හැකි ය යි ජනාධිපතිවරයා කියා සිටී. ඔබ හා අප දන්නා හා ආදරය කරන ඇමරිකාවේ එවන් අයිතියක් ඇත්තේ නැත. එය අපගේ ව්‍යවස්ථාවට ආගන්තුක ය. එය ප්‍රතික්ෂේප කල යුතු ව ඇත.

"එ සමග ම තමන් භාරේ සිටින්නා වූ සිරකරුවන්, පැහැදිලිව ම වධ දීම් සංඛ්‍යාත වන්නා වූ ද පෘථුල ලෙස ලියකියවිලිවලින් තහවුරු කර ඇති පරිදි ලෝකයේ රටරටවල් ගනනාවක් තුල පිහිටා ඇති එක්සත් ජනපද කඳවුරුවල පලල් වධදීම් රටාවක් යයි තහවුරු වී ඇත්තා වූ ද අන්දමක අඩන්තේට්ටම්වලට සිරකරුවන් භාජන කිරීම සඳහා ද (රාජ්‍යයේ) විධායක අංශය පෙර නොපිලිගත් විරූ බලාධිකාරයකට හිමිකම් කියා පා ඇත.

''මෙම සිරකරුවන්ගෙන් 100 දෙනෙක් පමන විධායක අංශයේ ප්‍රශ්න විභාගකයන් විසින් වධ දෙන විට මියගොස් ඇතැයි වාර්තා වී තිබේ. ඊට වඩා විශාල සංඛ්‍යාවක් ආත්ම ධෛර්යය බිඳ දමා අවමානයට පාත්‍ර කොට තිබේ. නම ගිය අබු ග්‍රයිබ් සිර කඳවුරේ වධදීම් රටා පිලිබඳ ලේඛන හා ඡායාරූප ඉදිරිපත් කල විමර්ශකයෝ මෙම වධයට පාත්‍ර වූ අයගෙන් සියයට 90ක් ම කුමන හෝ අපරාධ චෝදනා පිලිබඳ ව මුලුමනින් ම නිර්දෝෂය යි තක්සේරු කලහ. මේ වනාහි අපගේ විප්ලවවාදී යුද්ධය තුල දී ජෙනරාල් ජෝර්ජ් වොෂිංටන් ප්‍රථමයෙන් විස්තර කල තැන් පටන් අපගේ ජාතිය විසින් පිලිපැද ඇති මූලධර්මයන් මාලාවක් පෙරලා දමන්නාවූ නිර්ලජ්ජිත ලෙස බලය පාවිච්චි කිරීමක් වන්නේ ය. ඒවා එතැන් පටන් මේ දක්වා සෑම ජනාධිපති වරයෙකු විසින් ම පිලිපැද ඇත. මෙය ජිනීවා චර්යා ධර්ම මාලාව ද, වධදීම්වලට එරෙහි ජාත්‍යන්තර සම්මුතිය ද වධදීම්වලට එරෙහි අපගේ ම නීති ද උල්ලංඝනය කරයි.

"විදේශීය නගරවල වීදි මධ්‍යයේ දී පුද්ගලයන් පැහැරගෙන අප වෙනුවෙන් ඔවුන් සිර කර තැබීම සහ ප්‍රශ්න කිරීම සඳහා, වධක තාක්ෂනයේ කුරිරු භාවයට නම් දරා සිටින අත්තනෝමතික රාජ්‍යයන්ට භාරදීමට තමාට අධිකාරයක් ඇතැයි ජනාධිපතිවරයා විසින් කියා පා ඇත. අලුත් වූ ද ඇමරිකානුවන්ගේ පැත්තෙන් ගත්තොත් නුහුරු නුපුරුදු වූ ද මෙම රටාවන් විසින් අපගේ සමහර සාම්ප්‍රදායික මිත්‍රයෝ ගැඹුරින්ම කම්පාවට පත්ව සිටිති. සිර ගෙවල් තුල වධබන්ධන පිලිබඳව දරුනුතම කුප්‍රකට ජාතීන්ගෙන් එකක්වන - උස්බෙකිස්ථානයේ බ්‍රිතාන්‍ය තානාපතිවරයා තමාට දැකගන්නට ලැබුනු නව ඇමරිකානු භාවිතයේ දුෂ්ට බව ද, නිරර්ථක-නිර්දය භාවයද පිලිබඳව චෝදනාවක් තම රටේ අභ්‍යන්තර අමාත්‍ය කාර්යාලයට ලියා දන්වී ය."

එහි මෙසේ සඳහන් වේඃ "අපට මේ ලැබෙන තොරතුරු පලක් ඇති ඒවා නො වේ." ඔහු තවදුරටත් මෙසේ කීවේ යඃ "අපි අපගේ ආත්මයන් රොන් මඩවලට විකුනා දමමින් සිටිමු. මෙය අතිශයින් ම හානිකර ය."

"අපගේ ව්‍යවස්ථාව යටතේ කුමන ජනාධිපති වරයෙකුට හෝ මෙවන් බලයක් සැබැවින් ම තිබේ යයි කිව හැකි ද? උත්තරය "ඔව්" නම් මෙම ක්‍රියාවලට ප්‍රස්තුත වූ න්‍යාය යටතේ, පෙනීයන හැටියට තහනම් කල හැකි (ජනාධිපති වරයාගේ) මොනයම්මැ හෝ ක්‍රියාවක් පවතී ද? ජනාධිපතිවරයාට වරෙන්තුවකින් තොරව ඇමරිකානු පුරවැසියන් පිලිබඳව ඔත්තු බැලීමට ආවේනික අධිකාරයක් තිබේ නම්, තමාගේ ම ප්‍රකාශයක් මගින් ඇමරිකානු පුරවැසියෙකු සිරගත කිරීමට, බලෙන් පැහැරගෙන යාමට, හෝ වධයට පාත්‍ර කිරීමට ආවේනික බලයක් පවතී නම් ඉතින්, ඔහුට කල නොහැක්කේ කුමක් ද? "

"විධායක අංශයේ මෙම පෙර කවර කලෙක වත් නොපිලිගත් විරූ ප්‍රමානාතික්‍රාන්ත බලාධිකාර අයිතිය

දැක් වීම විශ්ලේෂනය කල යේල් විශ්වවිද්‍යාලයේ පීඨාධිපති හැරල්ඞ් කොක් මෙසේ ප්‍රකාශ කලේ යඨ

"වධ දීම්, සඳහා ව්‍යවස්ථාදායක බලය ජනාධිපතිට තිබේ නම් ජන ඝාතන සඳහා ද, වහල් භාවය අනුමත කිරීම සඳහා ද, වර්නභේදවාදය වගා කිරීම සඳහා දල සංක්ෂිප්ත විභාග මගින් මරන දන්ඩනය ක්‍රියාත්මක කිරීම සඳහා ද බලයක් ඔහුට තිබේග

"අපගේ සාමාන්‍ය ඇමරිකානු ආරක්ෂක විධි විධාන මේවනතුරුත් විධායක බලයේ මේ පෙර නුවූ විරූ ප්‍රසාරනය රඳවා තැබීමට අසමත්ව ඇතැයි යන කාරනය මල ගැඹුරෙන් සිත් චංචල කරයිග මෙම නො හැකියාවට තරමක් දුරට හේතු වී ඇත්තේ විධායක අංශය තොරතුරු අවුල් කර දැමීමේ, කල් මැරීමේ, සහ මුලුමනින්ම එලි නො කිරීමේ මූලෝපායක් අනුගමනය කිරීම යිත අනුගත වන බවක් අඟවා ඉක්බිති එසේ කිරීම ප්‍රතික්ෂේප කිරීම මගින් සෞඛ්‍ය සම්පන්න ව්‍යවස්ථා සමබරතාවක් යලි පිහිටුවාලීමට ව්‍යවස්ථාදායක සහ අධිකරන අංශ දරන්නා වූ ප්‍රයත්නයන් කඩාකප්පල් කර දැමීම සඳහා දැඩි අධිෂ්ඨාන සහගත මූලෝපායක් අනුගමනය කිරීමයිග,

අල් ගෝර් ඉහත විස්තර කර ඇත්තේ ව්‍යවස්ථානුකූල ප්‍රජාතන්ත්‍රයේ බිඳවැටීමත් ඇමරිකා එක්සත් ජනපදය ඒකාධිපතිත්වය තුලට ඇද වැටීමත් ය. අල් ගෝර්ගේ විස්තරය නිරවද්‍ය ය. එහෙත් ඔහුගේ කතාවේ කිසිසේත්ම දක්නට නැත්තේ මෙම භයංකර තත්වය පැන නැග ඇත්තේ මන්ද, කෙසේද  යන්න පිලිබඳ කුමන පැහැදිලි කිරීමක් හෝ නැති කම ය.

ධනවාදයේ ක්ෂමාලාපකයින් ද, ආරක්ෂකයින් ද කියන පරිදි ධනවාදය සෞඛ්‍ය සම්පන්නව පවතී නම්, ඉහල යන පථයකට පිවිස ඇත්නම් ඇමරිකා එක්සත් ජනපදය තුල ප්‍රජාතන්ත්‍රවාදය ද ජනප්‍රිය යයි කියනු ලබන ආන්ඩු ක්‍රමය ද පෙර නුවූ විරූ අර්බුදයකට පත්ව ඇත්තේ මන්ද?

මෙම සතියේ අප කැප වී ගන්නා ප්‍රධාන කාර්යය නම් ලෝක ධනේශ්වර පද්ධතියේ වේගයෙන් වර්ධනය වන අර්බුදයේ ප්‍රධාන ලක්ෂන පිලිබඳ දල සටහනක් සම්පාදනය කර ගැනීම ය.

1914 දී ලෙනින් මෙසේ ලිවීයඃ "අපෝහකයේ සාරය (නොවෙතොත් සාරභූතයන්ගෙන් එකක්, ප්‍රධානතම විලක්ෂනය නො වේ නම් විලක්ෂනයන්ගෙන් එකක්) වනාහි ඒකීය සමස්තයක් විභේදනය කොට එහි පරස්පර විරෝධී අංග ඥානනය කිරීම ය."

මෙම න්‍යායික ප්‍රවිෂ්ටයට අනුව, අපට (ඉදිරි දිනවල දී) අසන්නට ලැබෙනු ඇති වාර්තා විසින් භූගෝලීය අර්බුදයේ වර්ධනය එහි විවිධ අංශයන් සහ පැතිවලින් පරීක්ෂා කරනු ඇත. අප විමසීමට අපේක්ෂා කරන විෂයයන් අතරඃ ලෝක ආර්ථිකයේ තත්වය; එක්සත් ජනපදයේ දේශපාලන, ආර්ථික හා සමාජ අර්බුදය; චීනයේ ධනවාදය ප්‍රසාරනය වීමේ බලපෑම සහ විපාක; තීරක සම්පත් උදෙසා අරගලය සහ අන්තර් අධිරාජ්‍ය මහා බලවතුන් අතර ඝට්ටන; ශ්‍රී ලංකාවේ සිවිල් යුද්ධය යලි ඇරඹීම පිලිබඳ අන්තරාය ගැන විශේෂ අවධාරනයකින් යුතුව ඉන්දු උප මහාද්වීපයේ අර්බුදය; ඉරාකයේ වත්මන් තත්වය සහ එක්සත් ජනපදයේ 'ත්‍රස්ත විරෝධී යුද්ධයේ' අනාගතය, අප්‍රිකාවේ වියරු තත්වය; ඊස්රායලයේ දේශපාලන හා සමාජ භේද සහ ලතින් ඇමරිකානු දේශපාලනයේ සමහර මෑත 'වාම' ප්‍රවනතාවල අර්ථභාරය ඇතුලත්වනු ඇත. ජාත්‍යන්තර සංස්කෘතියේ වර්තමාන අර්බුදය පිලිබඳ විමර්ශනයකට ද යම් කාලයක් යෙදවීමට බලාපොරොත්තු වන්නෙමු.

මෙම වාර්තාවත් ලෝක සමාජවාදී වෙබ් අඩවිය දෛනික විශ්ලේෂනාත්මක වැඩ කටයුතුවල පදනම වන්නා වූ ජාත්‍යන්තරවාදී ඉදිරි දර්ශනය වර්ධනය කිරීමට ප්‍රතිපාදනයක් කරනු ඇතැයි යන්න අපගේ ප්‍රාර්ථනයයි; අපේක්ෂාවයි.

© www.wsws.org